**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය - 2015**

**-----------------------------------------------------------------**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 22 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI-1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) මණ්ඩලයට අයත් අලෙවිහලේ 2015 දෙසැම්බර් 31 දිනට පැවති වටිනාකම රු.2,744,946 ක් වූ තොගය, අවසන් තොගයට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල අවසන් තොගය එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) චීන තානාපති කාර්යාලයෙන් 2015 ඔක්තෝබර් 23 දින ලැබී තිබුණු රු. 2,000,000 ක් වූ ආධාර මුදල් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන ප්‍රදානයක් ලෙස දැක්වීම වෙනුවට පරිගණක යන්ත්‍ර 16 ක් මිලදී ගැනීම සඳහා සැපයුම්කරුවෙකුට ගෙවිය යුතු ලෙස රු.1,894,400 ක් හා රු.105,600 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙසත් හඳුනාගන තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.27,916,840 ක් වූ කාර්යාල ලී බඩු උපකරණවල වටිනාකම තුළ රු.936,787 ක් වූ ජංගම වත්කම් තොගයක් ඇතුළත්ව තිබුණි.

(ඈ) පරිත්‍යාග ලේඛනගත කිරීමේ හා ගිණුම් තැබීමේ ප්‍රතිපත්තියක් හඳුනානොගැනීම හේතුවෙන් 2015 වර්ෂයේ දී විවිධ ව්‍යාපෘති, ආයතන හා පුද්ගලික අංශය වෙතින් පරිත්‍යාග ලෙස මණ්ඩලය වෙත ලැබී තිබුණු මුද්‍රිත ප්‍රකාශන අගය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල වත්කම් පංති 5 කට අදාළව දක්වා තිබුණු ශේෂය රු.55,760,386 ක් වූ අතර වත්කම් සමීක්ෂණ වාර්තාව අනුව එම ශේෂය රු.40,816,500 ක් වූයෙන් රු. 14,943,886 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් ශේෂය අත්තිකාරම් ලේඛනය අනුව රු.640,625 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.619,242 ක් වූයෙන් රු.21,383 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වර්ෂ 3 සිට වර්ෂ 11 දක්වා පැරණි රු.240,651 ක් වූ රඳවා ගැනීම් බදු මුදල් විගණන අවස්ථාව වූ 2018 ඔක්තෝබර් 01 දින දක්වාම දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට රු.254,496 ක් වූ අත්තිකාරම් ශේෂය වර්ෂ 08 කට වඩා වැඩි කාලයක් ගතවී තිබූ නමුත් විගණන අවස්ථාව වූ 2018 ඔක්තෝබර් 01 වන දින වන විටත් පියවා නොතිබුණි. මෙයින් රු.121,970 ක ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත නොහැකි අත්තිකාරම් ලෙස දක්වා තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ආපදා ණය ශේෂය රු.12,200,290 ක් වූ අතර ආපදා ණය ලේඛනය අනුව ශේෂය රු.12,259,163 ක් වූයෙන් ඒ අනුව ඇතිව තිබුණු රු.58,873 ක වෙනස හඳුනාගත නොහැකි ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ලැබියයුතු දැ ලෙස දක්වා තිබුණි.

**2.4 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 371 | අවශ්‍යතාවය නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම නිසා කමිටු රැස්වීම් හා විවිධ මිලදී ගැනීම් සඳහා අවස්ථා 13 කදී ලබා දී තිබූ රු.160,500 ක් වූ අත්තිකාරම් මුදලින් රු.86,905 ක් ආපසු පියවා තිබූ අතර අවස්ථා 18 කදී ලබාදී තිබුණ රු.148,425 ක අත්තිකාරම් මුදල්, වියදම් කිරීමකින් තොරව නැවත පියවා තිබුණි. ඉන් අවස්ථා 06 කදී ලබාගත් රු.85,825 ක මුදලක් දින 10 සිට දින 29 ක අතර කාලයක් අත රඳවාගෙන හේතු නොදක්වා නැවත පියවා තිබුණි. |
| (ආ) | 2009 සැප්තැම්බර් 01 දිනැති අංක ඩීඑම්ඒ/2009(2) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.662,766 ක් වූ තොගය හා පිරිවැය රු.1,306,631 ක වත්කම් 2015 දෙසැම්බර් 31 දිනටද, පිරිවැය රු.98,715,386 ක් වූ ජාතික පුස්තකාල පොත් තොගය 1976 සිට 2015 වර්ෂය දක්වා වසර 36 කින්ද සමීක්ෂණය කර නොතිබුණි. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | |
| | (i) ඡේද අංක 2(ආ) | වත්කම් හඳුනාගැනීම, ගිණුම්ගත කිරීම හා ඒවායේ පාලනය පහසුකරවීම් වස් එක් එක් ස්ථාවර වත්කම් වෙනුවෙන් දෙපාර්තමේන්තුමය අංක ඇතුළත් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි |

| | | |
|---|---|---|
| (ii) | ඡේද අංක 2(ඇ) | එක් එක් ස්ථාවර වත්කම් වර්ගය වෙනුවෙන් ලෙජර ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (iii) | ඡේද අංක 2(ඉ) | ස්ථාවර වත්කම් ලේඛනයෙහි සටහන්වී ඇති මූල්‍ය දත්තයන් ස්ථාවර වත්කම් ලෙජරයෙහි සටහන්වී ඇති මූල්‍ය දත්තයන් හා සැසදිය හැකි පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 10,185,344 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,383,674 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,801,670 ක පිරිහීමක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය ප්‍රදාන රු. 12,585,000 කින් වැඩිවී තිබූ නමුත් පරිපාලන වියදම් රු.19,194,535 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේදී රු.14,129,348 ක් වූ ඌනතාවය සමාලෝචිත වර්ෂය වනවිට රු.10,185,344 ක් දක්වා අඛණ්ඩව අඩු වී තිබුණි. එහෙත් සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2011 වර්ෂයේ දී රු.46,379,665 ක් වූ මණ්ඩලයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.86,052,111 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෙළුම් හතරකින් හා ප්‍රස්තාවනාවකින් යුතු පන්සියපනස් ජාතක පොත නැවත මුද්‍රණය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට පවරා තිබූ නමුත් එම මුද්‍රණ කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදුකර නොතිබුණි. මෙම හේතුවෙන් පොතෙහි මුද්‍රණ කටයුතු මණ්ඩලය විසින් සිදුකිරීමට 2015 වර්ෂයේදී තීරණය කර තිබුණු අතර ප්‍රස්ථාවනාව සහ වෙළුම් 2 ක් 2017 වසර තුළ නිමකර තිබුණි. වෙළුම් III හා IV විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 30 දක්වාත් මුද්‍රණය කර නොතිබුණි.

(ආ) 1850 වර්ෂය දක්වා ප්‍රකාශනයට පත්ව ඇති පැරණි සාහිත්‍ය ග්‍රන්ථ නාමයන් සහ 1851 සිට 2000 වර්ෂය තෙක් එයට අදාළව ප්‍රකාශයට පත්ව ඇති සංස්කරණයන් ඇතුළත් කරමින් සාධිකාරී සිංහල ග්‍රන්ථනාම ලේඛනය සම්පාදනය කිරීමේ කටයුතු 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි සැලසුම් කර තිබූ නමුත් විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 30 දක්වාත් එම කාර්යය නිමකර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අලෙවියෙන් පසුව මුදල් ගෙවීමේ පදනම මත කතෘවරුන්ගෙන් ලබා ගෙන තිබුණු පොත් අලෙවිය සම්බන්ධයෙන් මණ්ඩලයේ සභාපතිවරයා, අංශ භාර අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ- පුස්තකාල ප්‍රවර්ධන ප්‍රමිතිකරණ විසින් වරින් වර මිල වෙනස් කිරීම් කර තිබූ අතර කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද ස්ථිර මිල ප්‍රතිපත්තියක් මණ්ඩලය විසින් හඳුන්වා දී නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මුද්‍රණය කරනු ලැබූ රු.2,392,489 ක් වටිනා මණ්ඩලීය ප්‍රකාශන 3,187 ක තොගයක් සහ වටිනාකම සඳහන් නොවන ප්‍රකාශන 4,753 ක තොගයක් විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 30 දින වන විටද ගබඩාවේ සහ ග්‍රන්ථ විඥාපන පාලන අංශය තුළ ඉතිරිවී තිබුණි.

(ඇ) සම්භාව්‍ය කෘති නැවත මුද්‍රණය යටතේ බුත්සරණ ග්‍රන්ථය සංස්කරණය කිරීම යටතේ අක්ෂර සංයෝජන කටයුතු සිදුකර මුද්‍රණය කිරීම සඳහා 2013 දෙසැම්බර් 02 දින අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත භාර දී තිබුණු අතර දෙපාර්තමේන්තුව විසින් අක්ෂර සංයෝජන කටයුතු පමණක් සිදුකර එය නැවත මණ්ඩලය වෙත පවරා තිබුණි. මණ්ඩලය විසින් සෝදුපත් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එය මුද්‍රණය කිරීම සඳහා මුද්‍රණායතනයක් වෙත 2017 සැප්තැම්බර් 11 දින භාරදී තිබුණද විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 30 දිනය දක්වාත් මුද්‍රණ කටයුතු අවසන් කර ලේඛනය ආපසු භාරදී නොතිබුණි.

(ඈ) 2012 වර්ෂයේ සිදුකරන ලද තොග සමීක්ෂණයේ දී පාඨක සේවා අංශය තුළ පොත් 7,917 ක අඩුවක් පවතින බව සමීක්ෂණ මණ්ඩලය විසින් අනාවරණය කරගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් මණ්ඩලය විසින් කරන ලද පරීක්ෂාවන් තුළින් පොත් 2,908 ක් සොයාගන තිබූ නමුත්, තවදුරටත් පැවති පොත් 5,009 ක ඌනතාවය සම්බන්ධව විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 30 දින දක්වාත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) පරිත්‍යාගශීලී ආයතන හා පුද්ගලයින් විසින් මණ්ඩලයට පරිත්‍යාග කරනු ලබන දේශීය හා විදේශීය විවිධ පොත් භාරගැනීම සඳහා මණ්ඩලයෙහි ක්‍රමවේදයක් නොතිබුණු අතර මෙම ප්‍රකාශන විධිමත් පරිදි ලේඛනගත කර හෝ එම වත්කම්වල ආරක්ෂාව පිළිබඳව ආරක්ෂිත වැඩ පිළිවෙලක් ඇතිකර හෝ නොතිබුණි.

(ඊ) 2014 දෙසැම්බර් 31 දිනට අපහරණය කළයුතු බවට සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව හඳුනාගෙන තිබූ රු.4,845,383 ක් වටිනා ස්ථාවර වත්කම් අයිතම 154 ක් 2015 වර්ෂයට අවසානය තෙක්ම අපහරණය කිරීමට කටයුතු සිදුකර නොතිබුණි.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව නියමිත කාලය තුළදී මිලදී ගැනීම් සිදු නොකිරීම හේතුවෙන් ඒ සඳහා ලබාදෙන ලද රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන සම්පූර්ණ වශයෙන් උපයෝජනය නොකිරීම නිසා 2015 ජනවාරි 01 දිනට රු. 12,972,000 ක් වූ උපයෝජනය නොකරන ලද රාජ්‍ය ප්‍රදාන ශේෂය 2015 දෙසැම්බර් 31 දිනට රු.48,498,000 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත හා එහි පිටපත් අදාළ අමාත්‍යාංශයට, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ අවුරුදු 2 මාස 6 ක ප්‍රමාදයකින් පසුව 2018 සැප්තැම්බර් 7 දින දීය. තවද 2016 සහ 2017 ගිණුම් වර්ෂයන් සඳහා මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය දක්වාත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5.2 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 5.2.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේදී මණ්ඩලයේ ඒ ඒ අංශවල අවශ්‍යතා හඳුනාගෙන ඉදිරි වර්ෂ සඳහා පිළියෙල කර කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වුවද, මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණේ 2015 අප්‍රේල් 10 දින දීය. එම ප්‍රසම්පාදන සැලැස්මද 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර දැක්වෙන ආකාරයෙන් සකස් කර නොතිබුණි.

### 5.2.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නව මධ්‍යගත වායුසමීකරණ පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 40 ක් ප්‍රසම්පාදනය කර ජාතික තරඟකාරී ලංසු කැඳවීමට ප්‍රසම්පාදන සැලැස්මෙහි සැළසුම් කර තිබුණද, ප්‍රථමයෙන් ඍජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ විදුලිබල මණ්ඩලයට පැවරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබියදී අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව එම නිර්දේශ ප්‍රතික්ෂේප කිරීමත්, ඒ සඳහා මාස 2 කට ආසන්න කාලයක් ගත කිරීමත්, හේතුවෙන් රු.මිලියන 40 ක් වූ අයවැය ප්‍රතිපාදන 2015 දෙසැම්බර් 31 දින වන විට ලැබී තිබූ නමුත් සැළසුම් කළ ආකාරයෙන් නිම කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන සැලැස්ම අනුව ඇස්තමේන්තුගත වටිනාකම රු.2,000,000 ක් වූ දෙවන මහලේ කාන්තා පිරිමි වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීම 2015 අප්‍රේල් මාසයේ ආරම්භ කර ජූලි මාසය වන විට අවසන් කිරීමට අපේක්ෂිතව තිබුණද එම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට 2015 නොවැම්බර් දක්වා ප්‍රමාදවී තිබුණි. කොන්ත්‍රාත් කාලය, රැඳවුම් මුදල්, ප්‍රමාද ගාස්තු, අත්තිකාරම් පිළිබඳ තොරතුරු කොන්ත්‍රාත් ගිවිසුමට ඇතුළත් කර නොතිබූ අතර අළුත්වැඩියා කටයුතු 2016 මාර්තු 23 දින නිමකර තිබුණි.

(ඇ) 2015 වර්ෂයෙහි සංරක්ෂණ උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන සැලැස්මෙහි වෙන්කළ ප්‍රතිපාදනය රු.1,900,000 ක් වූ අතර එයින් ඇස්තමේන්තුගත වටිනාකම රු.1,600,000 ක් වූ උපකරණ 6 ක් මිලදී ගෙන නොතිබුණි. කෙසේ වුවද 2015 වර්ෂය සඳහා සැලසුම් නොකරන ලද හා 2014 වර්ෂයේ සැලසුම් කරන ලද රු.2,136,195 ක් වටිනා සිදුරු පිරවුම් යන්ත්‍රයක් (Left casting machine) සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබුණු අතර සංරක්ෂණ උපකරණ සඳහා වෙන්කළ ප්‍රතිපාදනය රු.453,195 ක් ඉක්මවා වැය කර තිබුණි.

### 5.3 විගණන හා කළමනාකරණ කමිටු

2009 ජූනි 09 දිනැති අංක ඩී.එම්.ඒ/2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කාර්තුවකට එක බැගින් සිව් වතාවක් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාලව කමිටු රැස්වීම් 2 ක් පමණක් පවත්වා තිබුණි.

### 5.4 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත හා තත්‍ය ආදායම් වියදම් අතර සියයට 28 සිට සියයට 100 ක් අතර පරාසයක් තුළ සැලකිය යුතු විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) වත්කම් පාලනය | වත්කම් හා පොත් පරිත්‍යාග ලේඛනගත නොකිරීම. |
| (ආ) ගිණුම්කරණය | (i) ලෙජර ගිණුම් යාවත්කාලීනව පවත්වාගෙන නොයාම |
| | (ii) ලෙජර ගිණුම් හා උපලේඛන අතර නොසැසඳීම් පැවතීම. |
| | (iii) ගබඩා තොග පාලන ලෙජරය පවත්වාගෙන නොයාම . |
| | (iv) අවලංගු කළ චෙක්පත් ලේඛනයක් පවත්වාගෙන නොයාම. |
| (ඇ) ප්‍රසම්පාදනය | (i) සැලසුම් අනුව කටයුතු නොකිරීම. |
| | (ii) කොන්ත්‍රාත් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන නොයාම. |
| | (iii) භාණ්ඩ මිලදී ගැනීමේ ඇණවුම් පිටපත් හෝ ගිවිසුම් ලිපිගොණුවෙහි ඇතුළත්ව නොතිබීම. |
| (ඈ) අත්තිකාරම් | අත්තිකාරම් මුදල් පියවීමේ වවුචර් සහතික කර ලේඛනගත කිරීම සඳහා ප්‍රමාද පැවතීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ලේඛන හා පොත්පත් පවත්වාගෙන යාම | (i) | විගණන දිනය වු 2018 ඔක්තෝබර් 06 දක්වාත් 2015 වර්ෂය සඳහා ලෙජර් ගිණුම් සටහන් තබා නොතිබීම. |
| | | (ii) | 2016 සහ 2017 වර්ෂ සඳහා ලෙජර් ගිණුම් විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 01 දිනය දක්වාත් පවත්වා නොතිබීම. |
| | | (iii) | 2018 ඔක්තෝබර් 06 විගණන අවස්ථාව වනවිට අවලංගු කළ චෙක්පත් ලේඛනය, ක්ෂය ප්‍රතිපාදන උපලේඛන, ණයගැති හා ණයහිමි ලේඛන, ගබඩා තොග පාලන ලෙජරය, වැටිබදු ලේඛනය, සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ලේඛනය හා සැපයුම් ලේඛනය, කොන්ත්‍රාත් ලේඛනය, ටෙන්ඩර් තැන්පතු ලේඛනය, නොගෙවූ වැටුප් ලේඛනය, නොගෙවූ මුදල් ලේඛනය යන ලේඛන පවත්වා නොතිබීම. |